[ Annex 2(b) ]

K. NILMINI AMARASINGHE (BSc.)
Sworn Translator
Govt. Translator - Class I
Reg . No. 2013 / SE /KL 021
English / Sinhala
315/A, 11th, Lane, Dikhenapura, Horana.
Tel: 071 1922178

# ඇමිණුම I

## අධිකරණ නියෝගය

### අ. උසස් අධ්‍යාපන ආයතනවල නවක වදය මැඩලීම සඳහා වන මාර්ගෝපදේශ

1. සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම[1] නවක වදයට ලක් වූ වින්දිතයින් වෙනුවෙන් වින්දිතයින්ට සහාය වීමේ කමිටුවක්[2] ස්ථාපිත කළ යුතු අතර ඊට අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නියෝජිතයින්,[3] සුදුසුකම් ලත් උපදේශකයෙකු සහ/හෝ සායනික මනෝවිද්‍යාඥයෙකු,[4] නීතිය ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය හෝ සමාජ සේවා යන ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති, උසස් අධ්‍යාපන ආයතනයෙන් පරිබාහිර ස්වාධීන පුද්ගලයෙකු,[5] සහ ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) 3.5ක් සහිත, නිකැළැල් අධ්‍යයන හා විනය වාර්තා ඇති, අවසන් වසරේ සිසුන් තිදෙනෙකුට (03) නොවැඩි සංඛ්‍යාවක් ඇතුළත් විය යුතුය. උසස් අධ්‍යාපන ආයතනයේ පාලක සභාව විසින් පත් කරනු ලබන මෙම කමිටුව,[6] ස්ථාවර සේවා කාලයක් සඳහා පත් කළ යුතු අතර, පහත දක්වා ඇති බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතුය:

   අ) නවක වදයට ගොදුරු වූවන්ට සහ සාක්ෂිකරුවන්ට පැමිණිලි කිරීමට/සිද්ධීන් වාර්තා කිරීමට පැය 24 පුරා ක්‍රියාත්මක හදිසි ඇමතුම් අංකයක්/ඇමතුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීම;

   ආ) නවක වදය සම්බන්ධ සිදුවීම් පිළිබඳව කමිටුවට හෝ එහි කිසියම් සාමාජිකයෙකුට සෘජුවම කරනු ලබන පැමිණිලි/වාර්තා භාර ගැනීම;

-----------------------------------

1 "උසස් අධ්‍යාපන ආයතනය" යන පාඨයට 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි ඒ සඳහා ලබා දී ඇති අර්ථයම අදාළ වේ.

2 "නවක වදය" යන පාඨයට 1998 අංක 20 දරන, අධ්‍යාපන ආයතන තුළ නවක වදය සහ වෙනත් ආකාරයේ ප්‍රචණ්ඩ ක්‍රියා තහනම් කිරීමේ පනතෙහි ඒ සඳහා ලබා දී ඇති අර්ථයම අදාළ වේ. අවිනිශ්චිත බව දුරු කිරීම සඳහා, සයිබර් අවකාශයේ සහ සමාජ මාධ්‍ය තුළ සිදු කරනු ලබන නවක වදය ද ඊට ඇතුළත් වේ.

3 අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය, නිල බලයෙන් පත්වන සාමාජිකයින් (අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ නියෝජ්‍ය උපකුලපති (සිටී නම්), ශිෂ්‍ය කටයුතු භාර නියෝජ්‍ය ලේඛකාධිකාරී/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/සහකාර ලේඛකාධිකාරී සහ මාෂල්/පාලක/ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂ/ප්‍රධාන ශිෂ්‍ය උපදේශක වැනි), ස්ත්‍රී පුරුෂ සමානාත්මතා සහ සමානාත්මතා මධ්‍යස්ථානයේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයින්ගෙන්, සහ උපකුලපති විසින් පත් කරනු ලබන සාමාජිකයින්ගෙන් (නිශ්චිත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සංඛ්‍යාවක් වැනි) සමන්විත වේ.

4 උසස් අධ්‍යාපන ආයතනයක දැනටමත් ශිෂ්‍ය උපදේශකයින් සිටින අවස්ථාවක, එම ආයතනයේ පාලක සභාව විසින් පත් කරන ලද එවැනි ශිෂ්‍ය උපදේශකයෙකු හෝ කිහිප දෙනෙකු වින්දිතයින්ට සහාය වීමේ කමිටුව සඳහා සම-අනුමතිය මත පත් කර ගත හැකිය. එසේ නොමැති නම්, සිය වෘත්තීය සේවාවන් නොමිලයේ ලබා දීමට කැමති, සුදුසුකම් ලත් බාහිර උපදේශකයින් සහ/හෝ සායනික මනෝවිද්‍යාඥයින් හඳුනා ගැනීමට උසස් අධ්‍යාපන ආයතනයට හැකියාව ඇත.

5 එවැනි පුද්ගලයෙකු, ජ්‍යෙෂ්ඨ තනතුරක් දැරීමෙන් අනතුරුව රාජ්‍ය සේවයෙන් හෝ පෞද්ගලික අංශයෙන් විශ්‍රාම ගිය අයෙකු වීම වඩාත් සුදුසුය.

6 අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ආදි ශිෂ්‍යයින් හෝ විශ්‍රාමික මහාචාර්යවරුන් ද ස්වේච්ඡා පදනම මත පත්විය හැකිය.

ඇ) පැමිණිල්ලක් හෝ වාර්තාවක් ලැබීමෙන් පසු (අවම වශයෙන් දින 03ක් ඇතුළත) විනය පාලක, මාෂල්වරුන්, නේවාසිකාගාර භාරකරුවන්, හෝ ආරක්ෂක නිලධාරීන් වැනි අභ්‍යන්තර සහායක කාර්ය මණ්ඩලය බලමුලු ගැන්වීම සහ, අවශ්‍ය අවස්ථාවන්හිදී, නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ගේ සහාය ලබා ගැනීම ද සහිතව කඩිනම් ප්‍රතිචාරයක් ලබා දීම;

ඈ) වින්දිතයෙකුට තවදුරටත් හිරිහැරයට හෝ අපහසුතාවයට පත්වේ යැයි යන බියකින් තොරව, විධිමත් පැමිණිල්ලක් ගොනු කිරීම සඳහා (කමිටුව වෙත පැමිණිල්ල හෝ වාර්තාව ලැබුණු දින සිට අවම වශයෙන් වැඩ කරන දින 05ක් ඇතුළත) අවශ්‍ය සහාය ලබා දීම;

ඉ) අවශ්‍ය අවස්ථාවන්හිදී වින්දිතයාගෙන් පළමු පැමිණිල්ල සටහන් කර ගැනීම සඳහා පොලිසියට පහසුකම් සැලසීම පිණිස පොලිස් ස්ථානයකින් බැහැර මධ්‍යස්ථ ස්ථානයක විකල්ප ආරක්ෂිත ස්ථානයක් සැපයීම;

ඊ) නවක වදය සම්බන්ධ සිදුවීම් පිළිබඳ පැමිණිලි කිරීමේ සහ ඒවා පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳව වින්දිතයාගේ දෙමාපියන්ට හෝ වෙනත් පවුලේ සාමාජිකයින්ට උපදෙස් ලබා දීම;

උ) පොලිසිය විසින් පවත්වනු ලබන විමර්ශන පිළිබඳව (පැමිණිල්ල ඉදිරිපත් කළ දින සිට දින 14 කට නොඅඩු කාලයකදී) පසු විපරම් කිරීම සහ, වින්දිතයා පැමිණිල්ල ඉල්ලා අස්කරගෙන ඇත්නම් ඒ පිළිබඳව වහාම දැනුම් දීම;

ඌ) පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීමට හේතුව අනාවරණය කර ගැනීම සහ, උසස් අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයේ කිසියම් සාමාජිකයෙකු, වෙනත් ශිෂ්‍යයෙකු හෝ වෙනත් කිසියම් පුද්ගලයෙකු විසින් එසේ කිරීම සඳහා අනිසි බලපෑම් කර ඇති බවට අනාවරණය කර ගතහොත්, ඒ බව වහාම විනය පාලක වෙත දැනුම් දිය යුතු අතර, ඔහු විසින් එම සිදුවීම පිළිබඳව විමර්ශනය කර අවශ්‍ය පියවර ගැනීම සඳහා ඒ පිළිබඳව වහාම උපකුලපතිවරයා දැනුවත් කළ යුතුය;

එ) පැමිණිල්ල කර දින 30ක් ඇතුළත නවක වදය පිළිබඳ පැමිණිල්ලක් සම්බන්ධයෙන් පොලිසිය විමර්ශන ආරම්භ කිරීමට අපොහොසත් වුවහොත් හෝ පැමිණිල්ල ඉල්ලා අස්කර ගන්නා ලෙස වින්දිතයාට හෝ ඔහුගේ පවුලේ සාමාජිකයින්ට අනිසි බලපෑම් කළහොත්, කමිටුව විසින් උපකුලපතිවරයා වෙත දැනුම් දිය යුතු අතර, ඔහු විසින් අදාළ පොලිස් නිලධාරීන්ට එරෙහිව පොලිස්පතිවරයා වෙත පැමිණිල්ලක් කර එහි පිටපතක් නීතිපතිවරයා වෙත ද යැවිය යුතුය;

ඒ) වින්දිතයන් සඳහාවෙනුවෙන් ගාස්තු රහිතව නීතිමය නියෝජනයක් සැපයීමට සහ වින්දිතයන්ට යුක්තිය ඉටු කර ගැනීමට ප්‍රවේශය පහසු කිරීමට කැමැත්තෙන් පසුවන, ප්‍රමාණවත් පළපුරුද්දක් ඇති සහ උසස් අධ්‍යාපන ආයතනය පිහිටා තිබෙන පළාත තුළ නීති වෘත්තියේ යෙදෙන වඩාත් සුදුසු නීතිඥ මණ්ඩලයක් හඳුනා ගැනීගෙන ඔවුන්ගේ සහ ලබා ගැනීම[7];

ඔ) වින්දිතයා විසින් පැමිණිල්ලක් මේවන විටත් ගොනු කර නොමැති අවස්ථාවක, නවකවදය පිළිබඳ චෝදිත සිද්ධිය වාර්තා කිරීම සඳහා පොලිස් ස්ථානය වෙත යන වින්දිතයා සමඟ කමිටුවේ සාමාජිකයෙකු මෙන්ම ඉහත කී මණ්ඩලයේ නීතිඥයෙකු ද කැටුව යා යුතු බවට නියම කිරීම;

ඕ) අවශ්‍ය අවස්ථාවලදී, වෘත්තීය උපදේශන සහ මානසික සෞඛ්‍ය සේවා ඇතුළුව, වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට වින්දිතයන්ට පහසුකම් සැලසීම;

ක) 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය දීමේ සහ ඔවුන් ආරක්ෂා කිරීමේ පනත යටතේ ඇති විධිවිධාන උපයෝගී කර ගැනීම සඳහා වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට පහසුකම් සැලසීම;

ග) නවකවදයේ කම්පනය හේතුවෙන් අධ්‍යයන කටයුතු අතරමඟ නවතා දැමීම අවම කිරීමේ අරමුණින්, අදාළ නීති රීති සහ රෙගුලාසිවලට[8] අනුකූලව, අමතර උපකාරක පන්ති, නිවාඩු ලබා දීම සහ අධ්‍යයන කාලසීමා දීර්ඝ කිරීම වැනි සුබසාධන සහ සහන ක්‍රියාමාර්ග වින්දිතයෙකුට ලබා දිය යුතුද යන්න තක්සේරු කිරීමෙන් අනතුරුව ඒ පිළිබඳ නිර්දේශ කිරීම;

ජ) තම උපාධිය සම්පූර්ණ කරන තෙක් සියලුම වින්දිතයන්ට උසස් අධ්‍යාපන ආයතනය තුළ උපදේශන සේවා පවතී නම් ඒවාට හෝ, උසස් අධ්‍යාපන ආයතනයෙන් පිටත වෘත්තිකයන් හෝ අදාළ බලධාරීන් විසින් සපයනු ලබන අඛණ්ඩ උපදේශන සේවා වෙත ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම;

ට) කමිටුවේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී, එහි සෑම සාමාජිකයෙකුම වින්දිතයාගේ පෞද්ගලිකත්වයට ගරු කිරීමටත්, රහස්‍යභාවය රැකීමටත් වගබලා ගැනීම;

ඩ) නවකවදය වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳව, උසස් අධ්‍යාපන ආයතනයේ නවකවද-විරෝධී කමිටුවට සහ/හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රීය ඒකකයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

-------------------------------------------

7 විකල්පයක් ලෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නීතිඥවරුන්ගෙන් සැදුම්ලත් මධ්‍යම මණ්ඩලයක් සඳහා විධිවිධාන සැලසිය හැකිය. එම මණ්ඩලයෙන්, එක් එක් උසස් අධ්‍යාපන ආයතනයට නවක වදය හා සම්බන්ධ සිදුවීම් සම්බන්ධයෙන්, අවශ්‍ය විටදී, එක් එක් සිද්ධියට අදාළ පදනම මත ගාස්තු රහිත නීති සහාය ලබාගත හැකිය. උසස් අධ්‍යාපන ආයතනයට හෝ,අදාළ පරිදි, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට, මෙම නීතිඥ මණ්ඩලය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සහාය ලබාගත හැකිය.

8 මෙම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින නීති සහ රෙගුලාසි ප්‍රමාණවත් නොවේ නම්, උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒවා සංශෝධනය කිරීමට හෝ නව නීති හෝ රෙගුලාසි සකස් කිරීමට පියවර ගත යුතුය.

2. සෑම උසස් අධ්‍යාපන ආයතනයකම පහත දැක්වෙන අංග ඇතුළත්, ඵලදායී අභ්‍යන්තර විනය පරීක්ෂණ යාන්ත්‍රණයක් පැවතිය යුතුය:

අ) 2011.02.10 දිනැති, ශිෂ්‍ය විනය පිළිබඳ පොදු මාර්ගෝපදේශ සම්බන්ධ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 946 දරන චක්‍රලේඛයේ සහ ඊට සිදුකරන ලද ඕනෑම සංශෝධනයක දක්වා ඇති ක්‍රියා පටිපාටියට මෙන්ම, නවකවදය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වෙනත් ඕනෑම මාර්ගෝපදේශයකට හෝ විධානයකට දැඩි ලෙස අනුකූල වීම;

ආ) විමර්ශනය සහ පරීක්ෂණය පැවැත්වෙන කාලය තුළ, වින්දිතයාගේ, වරදකරුගේ සහ ඕනෑම සාක්ෂිකරුවෙකුගේ නිර්නාමිකභාවය මෙන්ම රහස්‍යභාවය හැකිතාක් දුරට පවත්වාගෙන යා යුතු අතර විධිමත් පරීක්ෂණ ක්‍රියාවලියේ විනිවිදභාවය, විශ්වසනීයත්වය සහ කාර්යක්ෂමතාව සහතික කිරීමේ අවශ්‍යතාවය උදෙසා අත්‍යවශ්‍ය වන අවස්ථාවකදී හැර, කිසිදු තොරතුරක් හෙළි නොකළ යුතුය;

ඇ) දෙපාර්ශ්වයම විශ්වවිද්‍යාල පරිශ්‍රයේ අධ්‍යයන කටයුතුවල නිරත වන අතරතුර පරීක්ෂණයක් පැවැත්වෙන අවස්ථාවක, වරදකරුට සහ, අවශ්‍ය නම්, ඔහුගේ ඕනෑම ආශ්‍රිතයෙකුට, වින්දිතයා හෝ කිසියම් සාක්ෂිකරුවෙකු අසලට පැමිණීම හෝ ඔවුන් සමඟ සන්නිවේදනය කිරීම සීමා කරමින් සම්බන්ධතා-නොපැවැත්වීමේ නියෝග පැනවිය යුතුය. පවතින සම්පත්ව අනුව, පරීක්ෂණය සිදුවෙමින් පවතින කාලය තුළ දෙපාර්ශ්වයම එකම නේවාසිකාගාර/නවාතැන් පහසුකම් භාවිත නොකිරීමට වගබලා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ද ගත යුතුය.

3. නවකවදය පිළිබඳ චෝදිත සිද්ධියක් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග විභාග වෙමින් පවතින හෝ, ශිෂ්‍යයෙකු නෙරපා හැරීමේ නියෝගයකින් තොරව එම ක්‍රියාමාර්ග අවසන් කර ඇති ඕනෑම ශිෂ්‍යයෙකුට, උසස් අධ්‍යාපන ආයතනය තුළ උපදේශන සේවා පවතී නම් ඒවාට හෝ, උසස් අධ්‍යාපන ආයතනයෙන් පිටත වෘත්තිකයන් හෝ අදාළ බලධාරීන් විසින් සපයනු ලබන උපදේශන සේවා වෙත ප්‍රවේශ වීමට සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම පහසුකම් සැලසිය යුතුය.

4. පවත්නා සම්පත් සහ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට යටත්ව, සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම, පහත සඳහන් දෑ ඇතුළු පියවර ගැනීමෙන්, විශ්වවිද්‍යාල සහ නේවාසිකාගාර පරිශ්‍රයන් තුළ තම සිසුන්ගේ මෙන්ම දේපළවල ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහතික කළ යුතුය:

අ) නේවාසිකාගාරවල නවාතැන් ගෙන සිටින සිසුන් සංඛ්‍යාව පිළිබඳව විශේෂයෙන් සලකා බලමින්, අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ උපාධි අපේක්ෂක සිසුන් සංඛ්‍යාවට අනුව සාධාරණ අනුපාතයක් මත ප්‍රමාණවත් පිරිමි සහ ගැහැණු පාලකවරුන්, මාෂල්වරුන්, නේවාසිකාගාර භාරකරුවන්, ආරක්ෂක නිලධාරීන්, ශිෂ්‍ය උපදේශකවරුන් සහ අනෙකුත් අනධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම;

ආ) නේවාසිකාගාර පරිශ්‍රය තුළ පාලකවරුන්න් සහ උප පාලකවරුන් සඳහා ප්‍රමාණවත් නවාතැන් පහසුකම් සැපයීම;

ඇ) විශ්වවිද්‍යාල සහ නේවාසිකාගාර පරිශ්‍රවල පොදු ස්ථාන ඵලදායී ලෙස නිරීක්ෂණය කිරීම සඳහා, ඇතුළුවන සහ පිටවන ස්ථාන, ආපනශාලා, ක්‍රීඩා පිටි, ව්‍යායාම ශාලා, කොරිඩෝ සහ ගමන් මාර්ගවල CCTV කැමරා සවි කිරීම, එමෙන්ම එම ප්‍රදේශවල ප්‍රමාණවත් ආලෝකකරණයක් (වඩාත් සුදුසු සංවේදක ආලෝකකරණය) සැපයීම, CCTV කැමරා සහ ආලෝකකරණ පද්ධති සෑම විටම මනා ක්‍රියාකාරී තත්ත්වයේ පවතින පරිදි නිසි නඩත්තුවක් සහතික කිරීම, සහ පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීම පිණිස නවකවද සිදුවීම්වල CCTV පටිගත කිරීම් සුරක්ෂිත කර තබා ගැනීම සහතික කිරීම;

ඇ) බලයලත් පුද්ගලයින්ට (මාෂල්වරුන්, නේවාසිකාගාර පාලකයින්, උප-පාලකයින් සහ ආරක්ෂක නිලධාරීන්) රාත්‍රී දර්ශන කැමරා, හඬ පටිගත කිරීමේ යන්ත්‍ර, ශරීරයේ පැළඳිය හැකි කැමරා (body cameras), අධි බලැති විදුලි පන්දම් සහ වෝකිටෝකි වැනි ඵලදායී සන්නිවේදන උපකරණ ලබා දීම;

ඉ) නේවාසිකාගාර පරිශ්‍රයන්හි පාලනයකින් යුතු ඇතුළුවීමේ සහ පිටවීමේ ස්ථාන ස්ථාපිත කිරීම[9];

ඊ) නේවාසිකාගාර නවාතැන් සඳහා ප්‍රවේශය, අවසර ලත් සිසුන්ට සහ උසස් අධ්‍යාපන ආයතනයේ බලයලත් කාර්ය මණ්ඩලයට පමණක් සීමා කිරීමටත්, අදාළ බලධරයාගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව අනෙකුත් සිසුන් ඇතුළු වෙනත් කිසිදු පුද්ගලයෙකුට ඊට ඇතුළුවීම තහනම් කිරීමටත් වගබලා ගැනීම;

උ) විශේෂයෙන්ම ප.ව. 6.00 සිට පෙ.ව. 6.00 දක්වා කාලය තුළ, බලයලත් පුද්ගලයින් විසින් විශ්වවිද්‍යාල සහ නේවාසිකාගාර පරිශ්‍රයන්හි නිතිපතා මුර සංචාරයේ යෙදීම සහ අහඹු ලෙස නිරීක්ෂණ චාරිකාවල යෙදීමට නියම කිරීම;

ඌ) සිද්ධියක් හදිසි අවධානයක් යොමු කළ යුතු සහ වහාම වාර්තා කිරීම අවශ්‍ය වන අවස්ථාවක් හැර, නවකවදයට අදාළ සිදුවීම් පිළිබඳව තම යටත් නිලධාරීන්ගෙන් අන්තර්වාර වාර්තා කැඳවීමට පාලකවරයාට/මාෂල්වරයාට නියම කිරීම, සහ පාලකවරයා/මාෂල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ශිෂ්‍ය කටයුතු අධ්‍යක්ෂවරයා හෝ නියෝජ්‍ය උපකුලපතිවරයා හරහා උපකුලපතිවරයා වෙත අන්තර්වාර වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරීමට නියම කිරීම;

එ) නේවාසිකාගාර පරිශ්‍ර සඳහා ශාරීරිකව සහ මානසිකව නිරෝගී නේවාසික භාරකරුවන් යෙදවීම;

ඒ) විශ්වවිද්‍යාල සහ නේවාසිකාගාර පරිශ්‍ර තුළ මත්පැන් පානය කිරීම සපුරා තහනම් කිරීම;

ඔ) ආරක්ෂක සහ සුරක්ෂිතතා ක්‍රියාමාර්ග පිළිබඳව නිතිපතා විගණන පැවැත්වීම;

ඕ) හදිසි ප්‍රතිචාර දැක්වීම, ගැටුම් නිරාකරණය සහ නවීන ආරක්ෂක ශිල්පීය ක්‍රම සහ තාක්ෂණය පිළිබඳව අදාළ නිලධාරීන්ට සහ ආරක්ෂක නිලධාරීන්ට පුහුණුව ලබා දීම, එමෙන්ම නවකවද සිද්ධියක් අනාවරණය වූ විට හෝ වාර්තා වූ විට[10] අනුගමනය කළ යුතු පැහැදිලි ක්‍රියා පටිපාටි සකස් කර තීරණය කිරීම;

ක) සංවිධානාත්මක නවකවද සිදුවීම්වල විය හැකි තර්ජන හඳුනා ගැනීමේ අරමුණින්, විශේෂඥ පුහුණුවෙන් මඟ පෙන්වනු ලබන, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් තෝරාගත් පිරිසකගෙන් සමන්විත අභ්‍යන්තර බුද්ධි අංශයක් පිහිටුවීම.

---

9.ඵලදායී ප්‍රවේශ පාලනයක් සඳහා ශිෂ්‍ය හැඳුනුම්පතේ ඩිජිටල් කාඩ්පතක්/බාර්කෝඩ් එකක් යෙදීම පිළිබඳ සලකා බැලිය හැකිය.

10.ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීමට, විශේෂයෙන්ම එම ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ සේවාවන් ලබා ගැනීම සඳහා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහාය ලබාගත හැකිය.

5. සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම (උ.අ.ආ.) ශිෂ්‍යයන් අතර මත්ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය වැනි අහිතකර ද්‍රව්‍ය භාවිතය මැඩලීම සඳහා පහත සඳහන් දෑ ඇතුළු පියවර ගත යුතුය:

අ) විශ්වවිද්‍යාල හෝ නේවාසිකාගාර පරිශ්‍රය තුළ සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය වැනි අහිතකර ද්‍රව්‍ය සම්බන්ධ ඕනෑම වරදක්[11] පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට හෝ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයට වහාම වාර්තා කිරීම;

ආ) අඛණ්ඩව දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සැපයීම මගින්, මත්ද්‍රව්‍ය මත්ද්‍රව්‍ය වැනි අහිතකර ද්‍රව්‍ය භාවිතයේ අන්තරායන් පිළිබඳව සියලුම සිසුන් දැනුවත් කිරීම;

ඇ) විශ්වවිද්‍යාල සහ නේවාසිකාගාර පරිශ්‍රයන්හි මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නිරන්තර සහ අහඹු සෝදිසි කිරීම් සිදු කිරීමට උසස් අධ්‍යාපන ආයතනය විසින් සේවයේ නියුතු බලයලත් පුද්ගලයින්ට අවසර දීම;

ඈ) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමෙන් පෙළෙන සිසුන් හඳුනා ගැනීමට සහ වින්දිතයින් සැපයුම්කරුවන්ගෙන් වෙන්කර හඳුනා ගැනීමට අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයට පුහුණුව ලබා දීම සඳහා විශේෂඥයින්ගේ සහාය ලබා ගැනීම;

ඉ) මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කර ඇති සිසුන්ට එම සේවාවන් වෙත ප්‍රවේශ වීමට සහාය වීම;

ඊ) මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම හේතුවෙන් ප්‍රතිකාර ලබන සිසුන් අධ්‍යාපනයෙන් ඉවත් වීම අවම කිරීමේ අරමුණින්, අමතර උපකාරක පන්ති ලබා දීම, නිවාඩු ලබා දීම සහ අදාළ නීති රීති[12]වලට අනුකූලව ඔවුන්ගේ අධ්‍යයන කාලසීමා දීර්ඝ කිරීම වැනි සුබසාධන සහ සහන ක්‍රියාමාර්ග සැපයීම.

6. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (වි.ප්‍ර.කො.) නවක වදය[13] පිළිබඳව දැනුවත් කිරීම සහ එයට එරෙහිව සටන් කිරීම සඳහා නිර්මාණය කරන ලද මූලික පාඨමාලාවක් සකස් කළ යුතුය. පාඨමාලා සංරචක මගින් පහත මාතෘකා ආවරණය විය යුතුය:

අ) මාර්ගගත (online) සහ ලිංගික හිංසනය ඇතුළුව, නවක වදය සහ වෙනත් ආකාරයේ හිංසනයන්ට අදාළ නීති;

ආ) නවක වදයේ බරපතල හා හානිකර ප්‍රතිවිපාක පෙන්වීම සඳහා, නවක වදයට ගොදුරු වූවන්ගේ සහ එය සිදුකළවුන් පිළිබඳ සිද්ධි අධ්‍යයන සහ සාක්ෂි;

ඇ) නවක වදය කිසිසේත්ම නොඉවසීමට හේතු සහ නවක සිසුන්ට වෙනසක් ඇති කරන්නන් බවට පත්වීම සඳහා වන මෙවලම්;

ඈ) නිදහස් චින්තනය සහ විචාරාත්මක චින්තනය වර්ධනය කිරීම;

-----------------------------------

[11] සංශෝධිත විෂ, අබිං සහ අන්තරාදායක ඖෂධ ආඥා පනත යටතේ හෝ මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ මැඩලීම සම්බන්ධයෙන් අදාළ වන වෙනත් ඕනෑම නීතියක් යටතේ වන වරදකි.

[12] මෙම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින නීති සහ රෙගුලාසි ප්‍රමාණවත් නොවේ නම්, උසස් අධ්‍යාපන ආයතනය විසින් ඒවා සංශෝධනය කිරීමට හෝ නව නීති හෝ රෙගුලාසි සකස් කිරීමට පියවර ගත යුතුය.

[13] මෙම මූලික පාඨමාලාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය/සමතාවය සඳහා වන මධ්‍යස්ථානය විසින් දැනටමත් සකස් කර ඇති ඕනෑම පාඨමාලාවකට අතිරේකව සහ එයට පරිපූරකව පැවතිය යුතුය.

ඉ) මානසික සෞඛ්‍ය ගැටලු හා සම්බන්ධ සෘණාත්මක ආකල්ප ඉවත් කිරීම සහ ධනාත්මක චින්තනය ඇතුළුව, ආතතිය කළමනාකරණය සඳහා වන මෙවලම්;

ඊ) සම වයස් ආධාරක කණ්ඩායම් නිර්මාණය කිරීම සඳහා දිරිමත් කිරීම;

උ) ප්‍රචණ්ඩත්වයෙන් තොර ගැටුම් නිරාකරණය;

ඌ) මත්ද්‍රව්‍ය භාවිතය සහ මත්පැන් පානයට එරෙහිව කටයුතු කිරීම;

එ) සිසුන්ගේ ශාරීරික, මානසික, සමාජීය සහ අධ්‍යාපනික යහපැවැත්මට බාධා වන ක්‍රියාකාරකම්වල නොයෙදී, නොමිලේ අධ්‍යාපනය ලැබීම පිළිබඳ සහ එහි අවස්ථා සහ වරප්‍රසාද උපරිමයෙන් ලබා ගැනීමේ යුතුකම පිළිබඳ අභිමානයක් ඇති කිරීම;

ඒ) බලා සිටින්නෙකු ලෙස මැදිහත් වීමේ ශිල්පීය ක්‍රම.

7. සෑම උසස් අධ්‍යාපන ආයතනයක් විසින්ම ඉහත සඳහන් මූලික පාඨමාලාව, සියලුම පළමු වසර සිසුන් සඳහා අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස පිරිනැමිය යුතුය. එම පාඨමාලාව පිළිබඳ අනිවාර්ය පුනරීක්ෂණ පාඨමාලාවක්, ජ්‍යෙෂ්ඨ සිසුන්ට (සිය පළමු වසර සම්පූර්ණ කළ සිසුන්) ඔවුන්ගේ ඉතිරි අධ්‍යයන වර්ෂවලදී වාර්ෂිකව පිරිනැමිය යුතුය.

8. පවත්නා සම්පත්වලට සහ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතියට යටත්ව, සහ විශේෂයෙන්ම පළමු වසරේ සිසුන් සහ ජ්‍යෙෂ්ඨ සිසුන් විශාල සංඛ්‍යාවක් ඉගැන්වීමේ වේලාවෙන් බැහැරව එකම ස්ථානයක රැස්වීම වැළැක්වීම මෙන්ම නවක වදයට ගොදුරු වීමේ අවදානම වැඩිවීම වැළැක්වීමේ අරමුණින්,

අ) සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම පෞද්ගලික නවාතැන් ස්ථානවල විකල්ප ශිෂ්‍ය නවාතැන් හඳුනාගෙන, නේවාසිකාගාර නවාතැන් අවම කළ යුතුය;

ආ) සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම අවම ප්‍රමිතීන් මත පදනම්ව එවැනි පෞද්ගලික නවාතැන් පරීක්ෂා කර ලියාපදිංචි කළ යුතු අතර, සිසුන්ට ඔවුන්ගේ අභිමතය පරිදි නවාතැන්[14] තෝරා ගැනීමට එම ලේඛනය ලබා දිය යුතුය;

ඇ) සියලුම පළමු වසර සිසුන් සඳහා එවැනි විකල්ප ශිෂ්‍ය නවාතැන් නොමැති අවස්ථාවක, හැකි සෑම විටම, පළමු වසර සිසුන් සඳහා නේවාසිකාගාර නවාතැන් වෙන් කළ යුතුය.

9. සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම තමන්ගේ අදාළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ කේන්ද්‍රය හරහා සහ වි.ප්‍ර.කො. හා අදාළ විශේෂඥයින්ගේ සහාය ඇතිව, සයිබර් අවකාශයේ සහ සමාජ මාධ්‍යවල නවක වදය මැඩලීම සඳහා පහත සඳහන් දෑ ඇතුළු පියවර ගත යුතුය:

අ) සයිබර් සම්බන්ධ නවක වදය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් මැඩලීම සඳහා පුළුල් සමාජ මාධ්‍ය ප්‍රතිපත්තියක් සකස් කර බලාත්මක කිරීම;

ආ) මාර්ගගත (online) නවක වදය හඳුනා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ශිෂ්‍ය සුබසාධන කාර්ය මණ්ඩලයට විශේෂඥ පුහුණුවක් ලබා දීම;

------------------------------------

14. ලියාපදිංචි පෞද්ගලික නේවාසිකාගාරවල සිටින අවශ්‍යතා සහිත සිසුන්ගේ නවාතැන් පහසුකම් සඳහා මහපොළ ශිෂ්‍යාධාරයට අමතරව මූල්‍ය ආධාර වෙන් කළ යුතුය. කුලී ගෙවීම උසස් අධ්‍යාපන ආයතනය විසින් දේපළ හිමියන්ට සෘජුවම සිදු කළ හැකිය. ශිෂ්‍යයාගේ නොසැලකිල්ල හෝ හිතාමතා කරන ලද ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් දේපළවලට වන ඕනෑම විනාශයක් සඳහා ශිෂ්‍යයාගේ වගකීම, පරිශ්‍රයේ ප්‍රමාණවත් ආරක්ෂාව සහ සනීපාරක්ෂාව සහතික කිරීමට බදු දෙන්නාගේ බැඳීම, සහ සිසුන්ගේ ආරක්ෂාව හා සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ අරමුණින් උසස් අධ්‍යාපන ආයතනයේ බලයලත් කාර්ය මණ්ඩලයට පරිශ්‍රයට ඇතුළු වීමට අවසර දීම ඇතුළුව, එවැනි ශිෂ්‍ය නවාතැන් සපයනු ලබන නියමයන් සහ කොන්දේසි ඇතුළත් ආදර්ශ ත්‍රිපාර්ශ්වික ගිවිසුමක් සකස් කළ හැකිය.

ඇ) නවක වදය දීමේ සිදුවීම් සංවිධානය කිරීම කල්තියා හඳුනා ගැනීමට සහ ඒවා වහාම අදාළ බලධාරීන්ට වාර්තා කිරීමට අධීක්ෂණ සහ බුද්ධි තොරතුරු පද්ධති ස්ථාපිත කිරීම;

ඈ) මාර්ගගත නවක වදයේ අන්තරායන් සහ එවැනි සිදුවීම් පිළිබඳව කටයුතු කරන්නේ/වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව සියලුම සිසුන් දැනුවත් කිරීම.

10. ශිෂ්‍ය සංගම් සහ ආයතනය තුළ ඇති වෙනත් ඕනෑම සංවිධානාත්මක ශිෂ්‍ය කණ්ඩායමක් නවක වදය ආරම්භ කිරීම හෝ ප්‍රවර්ධනය නොකරන බවට වගබලා ගැනීම සඳහා සෑම සෑම උසස් අධ්‍යාපන ආයතනයක් විසින්ම පහත සඳහන් දෑ ඇතුළු පියවර ගනු ලැබිය යුතුය:

අ) ශිෂ්‍ය සංගම් සහ ඒවායේ නිලධාරීන් සඳහා වන මැතිවරණවලදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ වාර්ගික සමතුලිතතාවය සහතික කිරීම, සහ ලිඛිත නීතියට[15] යටත්ව, තරඟකාරී කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජිත නිලධාරීන්ගේ ලැයිස්තුවක් මත තේරී පත්වනවා වෙනුවට, එක් එක් තනතුර සඳහා තනි අපේක්ෂකයින්ට තරඟ කළ හැකි ආකාරයට මැතිවරණ පැවැත්වීම;

ආ) නවක වදයට එරෙහි ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට සහ සිසුන් අතර ධනාත්මක ආකල්පමය හා චර්යාත්මක වෙනස්කම් ඇති කිරීමට ශිෂ්‍ය සංගම් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම;

ඇ) විශ්වීය වටිනාකම්, මානව හිමිකම් සහ නිදහස සහ සම වයසේ මිතුරන් හා අනෙකුත් සිසුන් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීමේ කුසලතා මත පදනම්ව, ධාරිතා ගොඩනැගීමේ අරමුණින් ශිෂ්‍ය සංගම් නියෝජිතයින්ට අඛණ්ඩ නායකත්ව පුහුණුවක් ලබා දීම;

ඈ) පළමු වසරේ සිසුන් සහ ජ්‍යෙෂ්ඨ සිසුන් ඇතුළු සියලුම සිසුන් එකිනෙකාට සමාන ගරුත්වයකින් සලකන ශිෂ්‍ය එකමුතුකම දිරිමත් කිරීම;

ඉ) ශිෂ්‍ය සංගම් නියෝජිතයින් සඳහා විශේෂ ශිෂ්‍ය උපදේශකයින්/මාර්ගෝපදේශකයින් පත් කිරීම සහ ඔවුන් අතර නිරන්තර හා සමීප සබඳතාවක් පැවැත්වීමට නියම කිරීම. මෙම කාර්යය සඳහා, එවැනි උපදේශකයින්/මාර්ගෝපදේශකයින්, උසස් අධ්‍යාපන ආයතනය විසින් ශිෂ්‍ය සංගම් වෙත පත් කරන ලද ජ්‍යෙෂ්ඨ භාණ්ඩාගාරිකවරුන් සමඟ සම්බන්ධීකරණය කළ යුතුය;

ඊ) අදාළ බලධාරීන් විසින් ගන්නා ලද ආරක්ෂක සහ සුරක්ෂිතතා පියවරයන්ට සහාය වීම සඳහා මෙන්ම, වින්දිතයින්ට ආධාර කිරීමේ කමිටුවට සහ නවක වදයට එරෙහි කමිටුවට මෙම මාර්ගෝපදේශ අනුව පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමට සහාය වීම සඳහා, නේවාසිකාගාරවල සිටින සිසුන් ද ඇතුළුව, ශිෂ්‍ය සහාය කණ්ඩායම් නිර්මාණය කිරීම.

11. සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම, අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම, පළමු වසර සිසුන් සඳහා වන සිය පිළිගැනීමේ වැඩසටහනේ කොටසක් ලෙස, ඔවුන්ගේ ආත්ම විශ්වාසය සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම සඳහා නායකත්ව පුහුණු වැඩසටහනක් හඳුන්වා දිය යුතුය. එවැනි පුහුණු වැඩසටහනකදී විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්ගත භාවය පිළිබඳව අවධාරණය කළ යුතුය.

-------------------------------------

15 මෙම මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතට සහ වෙනත් ඕනෑම ලිඛිත නීතියකට සිදු කළ යුතු සංශෝධන, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර හඳුනාගත යුතුය.

12. සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම උපදේශකත්ව වැඩසටහනක් හඳුන්වා දිය යුතු අතර, ඒ අනුව ශිෂ්‍ය කණ්ඩායමක් සඳහා උපදේශකයෙකු පත් කළ යුතු අතර එම උපදේශකවරයා එම කණ්ඩායම සමඟ නිරන්තර හා සමීප සන්නිවේදනයක යෙදිය යුතුය. යම් ශිෂ්‍යයෙකු නවක වදයට පක්ෂපාතී මානසිකත්වයක් දිගින් දිගටම පෙන්නුම් කරන බව උපදේශකවරයා විසින් හඳුනාගත හොත්, ශිෂ්‍ය උපදේශකවරයාගෙන් හෝ වෙනත් සුදුසුකම් ලත් වෘත්තිකයෙකුගෙන් විශේෂිත සේවාවන් ලබා ගැනීම සඳහා ඔහු යොමු කළ යුතුය

13. සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම උපකුලපතිවරයා විසින් පත් කරනු ලබන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නියෝජිතයින්, උසස් අධ්‍යාපන ආයතනයේ සිටින ශිෂ්‍ය උපදේශකවරුන් සහ වින්දිතයින්ට සහාය වීමේ කමිටුවේ ප්‍රධානියා වැනි නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන් සමන්විත නවක වද විරෝධී කමිටුවක් ස්ථාපිත කළ යුතුය. එම කමිටුව පහත දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීම, කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටු කිරීම කිරීම සිදු කළ යුතුය:

අ) නවක වද විරෝධී ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම සහ ඒවා ශක්තිමත් කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සම්පාදනය කර නිර්දේශ කිරීම;

ආ) නවක වද විරෝධී ක්‍රියාමාර්ග සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශිෂ්‍ය සංගමය සම්බන්ධ කර ගැනීම;

ඇ) නවක වදය සඳහා ශූන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තිය ප්‍රචලිත කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම;

ඈ) නවක වදය පිළිබඳව දැනුවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය ඇතුළු නිර්මාණාත්මක ක්‍රමෝපායන් භාවිතා කිරීම;

ඉ) නවක වද සිදුවීම් සහ පැමිණිලිවල ප්‍රතිඵල පිළිබඳ සංඛ්‍යාලේඛන පවත්වාගෙන යාම සහ උපකුලපතිවරයා වෙත අන්තර්වාරික වාර්තා සැපයීම. උපකුලපතිවරයා විසින් එම වාර්තා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය;

ඊ) අභ්‍යන්තර විනය පරීක්ෂණ හෝ අධිකරණ නඩු අවසන් වීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි, නෙරපා හරින ලද හෝ වරදකරුවන් වූවන්ගේ අනන්‍යතාවය ප්‍රසිද්ධ කිරීම;

උ) නවක වදය පිළිබඳව ප්‍රජාව අතර දැනුවත්භාවය තර කිරීම සහ වින්දිතයින්ට ඔවුන්ගේ අධ්‍යාපනයට බාධාවකින් තොරව පැමිණිලි කිරීමට සහ පවත්වාගෙන යාමට සහාය වීමේ වැදගත්කම මෙන්ම, නවක වදයේ බරපතල ප්‍රතිවිපාක පිළිබඳව වරදකරුවන්ට උපදෙස් දීමේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම සඳහා සිසුන්ගේ දෙමාපියන් සහ පවුල් ඇතුළු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීම.

14. නවක වද සිදුවීමක් වාර්තා කිරීමට අපොහොසත් වන හෝ පැමිණිල්ලක් කිරීමෙන්/පවත්වාගෙන යාමෙන් වැළකී සිටීමට හෝ එවැනි සිදුවීමක් පිළිබඳ පරීක්ෂණයක/විමර්ශනයක දී සහයෝගය නොදීමට වින්දිතයෙකුට හෝ සාක්ෂිකරුවෙකුට බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට උත්සාහ කරන අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකුට එරෙහිව සෑම උසස් අධ්‍යාපන ආයතනයක්ම විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

15. විශේෂයෙන්ම, උසස් අධ්‍යාපන ආයතනයක වින්දිතයින්ට සහාය වීමේ කමිටුවකට සංකීර්ණ කටයුත්තකදී අවශ්‍ය සහාය ඵලදායී ලෙස ලබා දීමට නොහැකි වන අවස්ථාවලදී සේවා සැපයීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමානාත්මතාවය/සමානත්වය සඳහා වූ මධ්‍යස්ථානය හරහා, ශාස්ත්‍රඥයින්, සුදුසුකම් ලත් උපදේශකයින් සහ/හෝ සායනික මනෝවිද්‍යාඥයින්, වෛද්‍ය වෘත්තිකයන් සහ නීතිඥවරුන්ගෙන් සමන්විත මධ්‍යම වින්දිතයින්ට සහාය වීමේ කමිටුවක් ස්ථාපිත කළ යුතුය.

16. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, බහුවිෂයීක කාර්ය සාධක බලකායක් ස්ථාපිත කළ යුතු අතර, උසස් අධ්‍යාපන ආයතන වෙත ගොස් වරින් වර නවක වද විරෝධී වැඩසටහන් පවත්වන පුද්ගලයින්ගේ ජාලයක් නිර්මාණය කළ යුතුය. නාට්‍ය වැඩසටහන්, චරිත නිරූපණය, ප්‍රසාංගික කලාවන් සහ වෙනත් නව්‍ය ආකාර හරහා කරනු ලබන දැනුවත් කිරීම් ඊට ඇතුළත් විය යුතුය.

17. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතනවලට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතුය. කාර්ය මණ්ඩල සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සහ අදාළ අනුමැතීන් ලබා ගැනීමට ක්‍රියාකාරී පියවර ගැනීම, විශේෂඥ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට පහසුකම් සැලසීම, නවක වදය මැඩලීම සඳහා පදනම් පාඨමාලා සංවර්ධනය කිරීමට සහ සැලසුම් කිරීමට සහාය වීම, සහ නවක වද සිදුවීම් සහ උසස් අධ්‍යාපන ආයතන විසින් ඒවාට දක්වන ප්‍රතිචාරවල ඵලදායීතාවය නිරීක්ෂණය කිරීම ඊට ඇතුළත් වේ.

18. පවත්නා සම්පත්වලට සහ අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතීන්ට යටත්ව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව, වින්දිතයෙකුට වෘත්තීය සෞඛ්‍ය සේවා (ශාරීරික හෝ මානසික), ආබාධිත තත්ත්වයට අවශ්‍ය උපකරණ, නවක වදය නිසා ඇති වූ දුර්වලතා හේතුවෙන් අවශ්‍ය වන විශේෂ ඉගෙනුම් උපකරණ, හෝ වෙනත් ආකාරයකින් නොමිලේ ලබා දිය නොහැකි විශේෂ නවාතැන් අවශ්‍ය වන අවස්ථාවලදී මූල්‍ය ආධාර සඳහා වන ඉල්ලීම් සලකා බැලීම සඳහා වින්දිතයින්ට සහාය වීමේ අරමුදලක් ස්ථාපිත කළ යුතුය.

19. උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් කරගනු ලබන සෑම ශිෂ්‍යයෙකුටම ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන ආරම්භ කිරීමට පෙර මෙම මාර්ගෝපදේශවල පිටපතක් ලබා දිය යුතුය. සෑම උසස් අධ්‍යාපන ආයතනයකම පිළිගැනීමේ වැඩසටහනට මෙම මාර්ගෝපදේශවල විධිවිධාන සහ ඒවා කඩ වූ අවස්ථාවක පවතින පිළියම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා වන අනිවාර්ය සැසියක් ඇතුළත් විය යුතුය. මෙම මාර්ගෝපදේශ සහ නවක වදය මැඩලීම සඳහා වන අනෙකුත් යාන්ත්‍රණයන් පිළිබඳව සමාජ මාධ්‍ය හරහා ඇතුළුව, නිරන්තරයෙන් සිසුන් වෙත සන්නිවේදනය කළ යුතුය.

ආ. 3 වන, 4 වන සහ 6A සිට 21A දක්වා එකතු කරන ලද වගඋත්තරකරුවන් ලෙස ලැයිස්තුගත කර ඇති උසස් අධ්‍යාපන ආයතනවලට, ඉහත සඳහන් අංක 1, 2, 3, 4, 5, 7, 8, 9, 10, 11, 12, 13, 14 සහ 19 දරන මාර්ගෝපදේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135(1)(d) වගන්තියට අනුව අතුරු ව්‍යවස්ථා සකස් කරන ලෙසට නියෝග කරනු ලැබේ.

ඇ. ඉහත සඳහන් අංක 6, 15, 16 සහ 17 දරන මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල පනතේ 15(xii) වගන්තිය යටතේ ඇති සිය බලතල අනුව පියවර ගන්නා ලෙසට 1 වන වගඋත්තරකරුට නියෝග කරනු ලැබේ.

ඈ. ඉහත කී උසස් අධ්‍යාපන ආයතන විසින් ඉහත කී අතුරු ව්‍යවස්ථා පිළිපැදීම පිළිබඳව විමර්ශනය කර, ඒ පිළිබඳව සෑම මාස 6කට වරක් වාර්තා කරන ලෙස, විශ්වවිද්‍යාල පනතේ 20(2)(a) වගන්තියට අනුව 1 වන වගඋත්තරකරුට නියෝග කරන ලෙසට 22B වන වගඋත්තරකරුට නියම කරනු ලැබේ.

ඉ. මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය, තාක්ෂණික සහ අනෙකුත් සහාය අදාළ බලධාරීන්ගෙන් ලබා ගැනීම සහතික කිරීමට කඩිනම් පියවර ගන්නා ලෙසට ද 22B වන වගඋත්තරකරුට නියම කරනු ලැබේ.

ඊ. විශ්වවිද්‍යාල පනතේ 33 වන වගන්තියට අනුව විශ්වවිද්‍යාලයේ නිලධාරියෙකු ඇතුළුව, ඉහත කී උසස් අධ්‍යාපන ආයතනවල කිසියම් තනතුරක් දරන කිසියම් පුද්ගලයෙකු, ඉහත කී අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්යයන් හෝ කර්තව්‍යයන් ඉටු කිරීමට අපොහොසත් වුවහොත්, අදාළ වන ලිඛිත නීතියට අනුව ඔහුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා, අවස්ථාවෝචිත පරිදි, අදාළ පත් කිරීමේ බලධාරියාට හෝ විනය බලධාරියාට මෙන්ම 1 වන වගඋත්තරකරුට ද ඔහු පිළිබඳව වාර්තා කළ යුතුය.

උ. නවක වද සිදුවීමක් සම්බන්ධයෙන් පවත්වනු ලබන සෑම විමර්ශනයකදීම, සහ ඊට සම්බන්ධ කරුණු, එනම් කිසියම් පුද්ගලයෙකු විසින් එවැනි විමර්ශනයකට සම්බන්ධ පොලිස් නිලධාරියෙකුට, වින්දිතයෙකුට හෝ සාක්ෂිකරුවෙකුට අනිසි ලෙස බලපෑම් කිරීමට දරන කිසියම් උත්සාහයක් වැනි අධිකරණයේ කටයුතුවලට බාධා කිරීම් සම්බන්ධයෙන්, නීතිපතිවරයාගේ උපදෙස් ලබාගන්නා ලෙස ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය උපදෙස් නිකුත් කරන ලෙසට 23B වන වගඋත්තරකරුට නියෝග කරනු ලැබේ.

ඌ. මෙම නියමයන්, නවක වදය මැඩලීම සඳහා වගඋත්තරකරුවන්ගේ බලතල යටතේ ක්‍රියාත්මකව පවතින යාන්ත්‍රණයන්ට පරිපූරක වේ. කෙසේ වෙතත්, එවැනි යාන්ත්‍රණයන් සහ මෙම නියමයන් අතර කිසියම් නොගැලපීමක් සිදු වුවහොත්, මෙම නියමයන් බල පැවැත්විය යුතුය.

K. NILMINI AMARASINGE (BSc.)
Sworn Translator
Govt. Translator - Class I
Reg . No. 2013 / SE /KL 021
English / Sinhala
315/A, 11th, Lane, Dikhenapura, Horana.
Tel: 071 1922178